# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2026/45 – 2017 ජූලි මස 07 වැනි සිකුරාදා – 2017.07.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත**

2 වන වගන්තිය යටතේ නියමය

1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය, ගාර්දිහේවා සරත් චන්ද්‍රලාල් ෆොන්සේකා වන මම, මුදල් විෂයය, පවරන ලද අමාත්‍යවරයා හා ජාතික ප්‍රතිපත්ති විෂයය පවරන ලද අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මේ නියමය මගින් 1978 පෙබරවාරි මස 1 වැනි දින අංක 302/12 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

1. (5) වන ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

“(5) අධිකාරියේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ විය යුතු යැයි සඳහන් කරමි;”

2. (7) වන සහ (8) වන ඡේද ඉවත් කිරීමෙන්;

3. “පළමුවන උපලේඛනය”, යන වචන වෙනුවට “උපලේඛනය” යන වචනය ආදේශ කිරීමෙන්;

4. උපලේඛනයේ (1) වන අයිතමයේ “අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලබන ප්‍රදේශවල සංස්ථාව විසින් හෝ ආණ්ඩුවේ නැතහොත් ආණ්ඩුවේ නොවන නියෝජිත ආයතන” යන වචන වෙනුවට “සංස්ථාව විසින් හෝ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන නියෝජිත ආයතන” යන වචන ආදේශ කිරීමෙන්;


1A – PG3599 – 507(2017/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. උපලේඛනයේ (5) වන අයිතමයේ ''සියලු පියවර ක්‍රියාත්මක කිරීම.'' යන වචන වෙනුවට ''සියලු පියවර ක්‍රියාත්මක කිරීම;'' යන වචන ආදේශ කිරීමෙන්;

6. උපලේඛනයේ (5) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම ඇතුළත් කිරීමෙන් :-

''(6) වාණිජ කෘෂිකාර්මික වගාව හෝ වෙනත් යම් කෘෂිකාර්මික ව්‍යාපාරයන්හි දේශීය සහ විදේශීය කෘෂිකර්මාන්ත ආයෝජන සඳහා දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සහාය ලබාදීම. ;

(7) අධිකාරිය සමඟ හවුල්කාරත්වයක් ඇතිව හෝ නැතිව රාජ්‍ය නොවන නියෝජිත ආයතන, පුද්ගලික අංශය හෝ ගොවීන් විසින් භාර ගන්නා ලද එවැනි කෘෂි කර්මාන්ත ආයෝජන ඇති කිරීම සඳහා සැළසුම් කිරීම සහ එම සැළසුම් ක්‍රියාත්මක කිරීම, සේවාවන් සැපයීම සහ විශේෂඥ දැනුම ලබා දීම''.

7. එම නියමයේ දෙවන උපලේඛනය යටතේ කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි එම දෙවන උපලේඛනය ඉවත් කිරීමෙන්;

8. මෙම නියමයේ -

(අ) ''කෘෂිකර්මාන්තය'' යන්නෙන් වගා අංශය වෙත භෞතික යෙදවුම් සැපයීම සහ දේශීය සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ ඉල්ලුම ඉලක්ක කර ගනිමින් කෘෂිකාර්මික අමුද්‍රව්‍ය පරිවර්තනය, බෙද හැරීම හෝ අන්‍යාකාරයෙන් ඒ සඳහා වටිනාකමක් එකතු කරන ඕනෑම ව්‍යාපාරයක් හෝ ආයතනයක් අදහස් වේ;

(ආ) ''වාණිජ වගාව'' යන්නට වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් කරනු ලබන බෝග වගාව, පශු සම්පත් පාලනය, උද්‍යාන විද්‍යාව, මල් වගාව සහ පටපණු වගාව ඇතුළත් වේ; සහ

(ඇ) ''වෙනත් කෘෂිකාර්මික ව්‍යවසායයන්'' යන්නට පටක රෝපණය, කාබනික පොහොර නිෂ්පාදනය, ආහාර හා ආහාරයට සුදුසු තෙල් සැකසීම, ඖෂධීය බෝග උපයෝගී කරගනිමින් ඖෂධ නිෂ්පාදනය, කෘෂිකාර්මික සංචාරක ව්‍යාපාරය, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ ඒ හා සම්බන්ධිත වෙනත් උපාංග නිෂ්පාදනය සහ කෘෂිකර්මය, උද්‍යාන විද්‍යාව සහ වැවිලි බෝග මත පදනම් වූ එවැනි වෙනත් කර්මාන්ත ඇතුළත් වේ.

ෆීල්ඩ් මාර්ෂල් ගාර්දිහේවා සරත් චන්ද්‍රලාල් ෆොන්සේකා,
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය.

2017ක් වූ ජූලි මස 7 වැනි දින,
රාජගිරිය,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
අංක 1090,
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

07-762

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.